(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 152.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2026 මැයි 22 සිකුරාදා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

1186/2025

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිලිනොච්චි දිස්ත්‍රික්කයේ, කරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කිලි/කිලිනොච්චි මධ්‍ය මහා විද්‍යාලය යනුවෙන් ජාතික පාසලක් තිබෙන බවත්;

(ii) කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ඇති ජාතික පාසල් දෙකෙන් එකක් වන ඉහත පාසලේ අධ්‍යාපන මට්ටම මේ වනවිට පසුබෑමට ලක්වී ඇති බවත්;

(iii) පාසලේ අධ්‍යයන, අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සහ ගෘහ භාණ්ඩ ඇතුළු සම්පත් හිඟයක් පවතින බවත්;

(iv) එම පුරප්පාඩු නොපුරවා සිසුන්ගේ අධ්‍යාපන මට්ටම ඉහළ නැංවිය නොහැකි බවත්;

එතුමිය පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත පාසලේ මේ වනවිට සේවය කරනු ලබන විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පතිවරුන්, ගුරුවරුන් සහ අනධ්‍යයන සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පාසලේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු මේ දක්වා නොපිරවීමට හේතු කවරේද;

(iii) ඉහත පාසලේ පවතින සියලු පුරප්පාඩු සම්පූර්ණයෙන්ම පුරවනු ලබන දිනය කවරේද;

(iv) ඉහත පාසලේ ගොඩනැගිලි සහ ගෘහ භාණ්ඩ අවශ්‍යතාවය සම්පූර්ණ කරනු ලබන දින වකවානු කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1360/2025

ගරු තුරෛරාසා රවිකරන් මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුල්ලිකුලම් ප්‍රදේශයේ ජනතාවට අයත් ඉඩම් 2007 වර්ෂයේ සිට යුද හමුදාව යටතේ පවතින බැවින්, එම ප්‍රදේශයෙන් අවතැන්වූ ජනතාවට මේ වන තෙක් තමන්ගේ ගම්මානවලට ආපසු යෑමට නොහැකිවී ඇති බව දන්නේද;

(ii) එම ජනතාවට තමන්ගේ වාසස්ථානවල නැවත පදිංචි වීමට නොහැකි වීමට හේතු කවරේද;

(iii) මෙම ප්‍රදේශයේ අවතැන්වූ පවුල් 300කට අධික සංඛ්‍යාවකට නිසි නිවාස පහසුකම්, ජීවනෝපාය අවස්ථා සහ මූලික පහසුකම් නොමැති අතර, එම ජනතාව වෙනුවෙන් රජය විසින් මෙතෙක් ලබාදී ඇති සහන කවරේද;

(iv) මුල්ලිකුලම් ජනතාව සතු පාරම්පරික ඉඩම්, නිවාස, පාසල් සහ ආගමික ස්ථාන වර්තමානයේ නාවික හමුදාව යටතේ පවතින්නේද;

(v) එසේ නම්, ඒවා නිදහස් කොට ජනතාවට නැවත භාරදීමට ගනු ලබන පියවර කවරේද;

(vi) එම අවතැන්වූ ජනතාව ඔවුන්ගේ ස්ථිර වාසස්ථානවල නැවත පදිංචි කිරීම සඳහා තිරසර සැලැස්මක් හෝ නිශ්චිත කාලරාමුවක් තිබේද;

(vii) එසේ නම්, එම ක්‍රියාදාමය සම්පූර්ණ කිරීමට අපේක්ෂා කරන කාල වකවානුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1407/2025

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වවුනියා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ජාතික නිවාස සංවර්ධන අධිකාරියට භාර කර ඇති 2011 වර්ෂයේදී රජයේ සේවකයන්ට ලබා දුන් වවුනියාව දිස්ත්‍රික්කයේ ඕමන්ත-වේප්පන්කුලම් ප්‍රදේශයේ පර්චස් 20ක් බැඟින්වූ ඉඩම් කැබැලි 125ක් සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් දීමනා පත්‍ර ලබා දිය යුතු බව දන්නේද;

(ii) වසර 14කට පෙර රජයේ සේවකයන්ට ලබා දුන් සංවර්ධනය නොකළ එම ඉඩම් සංවර්ධනය කිරීමෙන් පසු වත්මන් වටිනාකමට ඇස්තමේන්තු කර තිබේද;

(iii) එසේ නම්, එම ඉඩම් ලබාදුන් අවස්ථාවේදී තිබූ වටිනාකම සැලකිල්ලට ගනිමින් එම දේපළ නැවත තක්සේරු කරනු ලබන්නේද;

(iv) නැවත ඇස්තමේන්තු කිරීම සිදු කරන කාලවකවානු කවරේද;

(v) නැවත ඇස්තමේන්තු කිරීමෙන් අනතුරුව, අදාළ පදිංචිකරුවන්ට ඉඩම් බලපත්‍ර ලබා දිය හැකි කාලවකවානුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1514/2025

ගරු රොෂාන් අක්මීමන මහතා,— වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට 2024 දක්වා ත්‍රිකුණාමලය වරායේ මෙහෙයුම් ලාභය/ අලාභය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ත්‍රිකුණාමලය වරායට අයිතිව තිබූ ජැටි හෝ පර්යන්ත බදු පදනම මත හෝ වෙනත් පදනමක් මත විවිධ පෞද්ගලික සමාගම් සඳහා ලබාදී තිබේද;

(iii) එසේ නම්, එම සමාගම් කවරේද;

(iv) ඉහත සමාගම් විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට ගෙවිය යුතු බදු හෝ වෙනත් ගෙවීම් නිසි පරිදි ගෙවා තිබේද;

(v) එසේ නම්, වර්ෂ 2005 සිට 2024 දක්වා එම ගෙවීම් සම්බන්ධ තොරතුරු එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ත්‍රිකුණාමලය වරාය සතුව පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් හෝ රජයේ හිමිකාරිත්වයක් සහිත ජැටි හෝ පර්යන්ත තිබේද;

(ii) එසේ නම්, එම ජැටි හෝ පර්යන්ත කවරේද;

(iii) ත්‍රිකුණාමලය වරාය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් පවතින සැලසුම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1547/2025

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශවල අනාරක්ෂිත ලෙස විදුලි කණු සහ විදුලි රැහැන් සවිකර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් නිසි විමර්ශනයක් සිදුකර තිබේද;

(iii) අඩු ධාරිතාවයකින් යුතු විදුලි රැහැන් පද්ධති පුළුල් කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1643/2025

ගරු ඉම්රාන් මහරුෆ් මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පානීය ජලය සපයා ඇති ප්‍රදේශ කවරේද;

(ii) එම දිස්ත්‍රික්කයේ මේ දක්වා පානීය ජලය ලබාදී නොමැති ප්‍රදේශ කවරේද;

(iii) කුච්චවේලි, පුඩවයික්කට්ටු, තිරියාය සහ සලෙප්පේයාරු ප්‍රදේශවලට පානීය ජලය සපයා නොමැති බැවින්, එම ප්‍රදේශවල ජීවත් වන පවුල් 4,000ක් පානීය ජලය ලබා ගැනීමේ දුෂ්කරතාවලට මුහුණදී ඇති බව දන්නේද;

(iv) එම ප්‍රදේශවලට කඩිනමින් පානීය ජලය සැපයීම සඳහා සැලැස්මක් ක්‍රියාත්මක කරනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1716/2025

ගරු ආර්.ජී. විජේරත්න මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2012 හා 2013 වර්ෂයන්හි ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ජාතික ගිණුම් අංශයේ සේවය කළ නිලධාරියෙකුගේ වැඩ තහනම් කළ බව දන්නේද;

(ii) එසේ නම්, එම නිලධාරියාගේ නම කවරේද;

(iii) එම නිලධාරියාට යුක්තිය හා සාධාරණත්වය ඉටු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ආර්ථිකය පිළිබඳ අධි සංවේදී දත්ත විකෘති කිරීම වළක්වා ගැනීම සඳහා වන වත්මන් රජයේ වැඩපිළිවෙළ කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1757/2025

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2008/04 චක්‍රලේඛය යටතේ ලාහුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් අයදුම් කළ ගොවීන් සංඛ්‍යාව සහ එම අයදුම්කරුවන් අතර පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ගොවීන් සංඛ්‍යාව;

(ii) එම ගොවීන්ට ලබාදුන් නව ඉඩම් බලපත්‍ර සංඛ්‍යාව;

(iii) ඉහත චක්‍රලේඛය අනුව පසුගිය වසර 17ක කාලය තුළ ලාහුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ලබාදුන් මුළු නව බලපත්‍ර සංඛ්‍යාව;

(iv) එම චක්‍රලේඛය යටතේ ඉල්ලුම් කර ඇති, මෙතෙක් නිකුත් කර නොමැති බලපත්‍ර සංඛ්‍යාව;

(v) නැගෙනහිර පළාත් ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ නිර්දේශය මත ලාහුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යොමුකර ඇති නමුත්, මෙතෙක් නිකුත් කර නොමැති බලපත්‍ර සංඛ්‍යාව;

කොපමණද යන්න ඉහත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ඉඩම් බලපත්‍ර නිකුත් නොකර රඳවා තබා ගැනීමට බලපෑ හේතු කවරේද;

(ii) එම බලපත්‍ර සුදුසු පුද්ගලයන් වෙත කඩිනමින් නිකුත් කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1908/2026

ගරු බී. ආරියවංශ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ගොරකා වගාකරන බිම් ප්‍රමාණය කොපමණද;

(ii) ගොරකා මිල නිරන්තරයෙන් උච්චාවචනය වීම හේතුවෙන් වගාකරුවන් පීඩාවට පත්වන බව පිළිගන්නේද;

(iii) එසේ නම්, ඔවුන් මුහුණ දෙන ගැටලු විසඳීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1990/2026

ගරු තිළිණ සමරකෝන් මහතා,— වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උත්සව සමයේදී ප්‍රමාණවත් සහල් තොග වෙළඳපොලට නිකුත් කිරීමට හැකියාවක් තිබේද;

(ii) සියලුම සහල් වර්ගවල පාලන මිල, සහල් වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) සීමාසහිත ලංකා සතොස මඟින් සහල් බෙදාහැරීමට සකසා ඇති වැඩපිළිවෙළ කවරේද;

(iv) ආනයනික සහල් වර්ග කවරේද;

(v) එම සහල්වල වර්තමාන මිල, සහල් වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය රට තුළ ප්‍රමාණවත් පරිදි ගබඩා කර තිබේද;

(ii) එම ආහාර ද්‍රව්‍ය පෞද්ගලික අංශය මඟින් පමණක් ආනයනය කරනු ලබන්නේද;

(iii) නොඑසේ නම්, ඒ සඳහා රාජ්‍ය අංශය මැදිහත් වන ආකාරය කවරේද;

(iv) සහල් සහ අනෙකුත් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල පාලනය කිරීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ප්‍රමාණවත් ලෙස මැදිහත් වන්නේද;

(v) එම අධිකාරිය මිල පාලනය සඳහා මැදිහත් වන ආකාරය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## ශෝක ප්‍රකාශ යෝජනා

1.

අභාවප්‍රාප්ත ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී.

2.

අභාවප්‍රාප්ත ගරු එස්. සී. මුතුකුමාරණ මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී.

3.

අභාවප්‍රාප්ත ගරු චන්ද්‍රදාස ගලප්පත්ති මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී.

4.

අභාවප්‍රාප්ත ගරු නන්දන ගුණතිලක මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී.

5.

අභාවප්‍රාප්ත ගරු ජනක් මහේන්ද්‍ර අධිකාරි මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී.

6.

අභාවප්‍රාප්ත ගරු ටී. කනගසබෙයි මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග යටතේ තීරණය,— රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2025.03.10 සහ 2025.03.21 දිනයන්හි මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව පිළිබඳව සිදු කරන ලද විමර්ශන සම්බන්ධයෙන් කරුණු ඇතුළත් 2025 ජූලි 25 දින පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 243 දරන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4)හි විධිවිධාන ප්‍රකාරව නීතිපතිවරයාගේ නිරීක්ෂණ සහ අවශ්‍ය කටයුතු සඳහා යොමුකරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව තීරණය කරයි.

*2.

මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත,— දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

සමථකරණ (සිවිල් සහ වාණිජ ආරාවුල්) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

විදුලිසංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත,— දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත,— දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

ජාතික පාරිසරික (සංශෝධන) පනත් කෙටුම්පත,— දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

ගෙවල් කුලී (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2025 සැප්තැම්බර් 24) [1].

*12.

බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2025 අප්‍රේල් 10),— “2025 මාර්තු 14 දින පාර්ලිමේන්තුවේ දී සභාගත කරන ලද බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුව විසින් සලකා බලනු ලැබිය යුතු ය.” යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

13.

පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

14.

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ (අවලංගු කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

15.

ශ්‍රී ලංකා පහසුකම් කළමනාකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

16.

ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

17.

කෝදාගොඩ ගුණරතන නාහිමි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

[1]

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

1.

2003/2026

ගරු රවී කරුණානායක මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2025 දෙසැම්බර් 31 දින වන විට කොළඹ මහ නගර සභා සීමාව තුළ සහ දිවයින පුරා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ඉදිකර වෙන් කර දෙන ලද මුළු නිවාස ඒකක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත සඳහන් ප්‍රතිලාභීන් අතරින් නීත්‍යානුකූලව අත්සන් කර ඇති සහ ලියාපදිංචි කළ හැකි සින්නක්කර ඔප්පු හෝ පැවරුම් සාධනපත්‍ර නිකුත් කරනු ලැබ නොමැති ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(iii) එකී ප්‍රතිලාභීන් සංඛ්‍යාව, ව්‍යාපෘතිය අනුව සහ එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එවැනි ඔප්පු නිකුත් කරනු ලැබීමෙන් වැළැකී සිටීමට හේතුවී ඇති නිශ්චිත නෛතික, මිනුම් සිතියම්, ඉඩම් අත්පත් කර ගැනීමේ හෝ ලියකියවිලි අඩුපාඩු කවරේද;

(v) පසුගිය වසර 03 තුළ කටයුතු සිදු කෙරෙමින් පවතින ලිපිගොනු සංඛ්‍යාව කොපමණද;

(vi) වැඩකටයුතු අවසන් නොකර ගොඩගැසී ඇති ඔප්පු ප්‍රමාණය 2026 වර්ෂය තුළ අවසන් කිරීම සඳහා වන මාසික ඉලක්ක ඇතුළත් කාල නියමයන් සහිත ක්‍රියාකාරී සැලැස්ම කවරේද;

(vii) පුරවැසියන්ට ඔවුන්ගේ ඉඩම් අයිතිවාසිකම් ලබා දීම දීර්ඝ කාලීනව ප්‍රමාදවී තිබීම සම්බන්ධයෙන් කිසියම් නිලධාරියෙකුට හෝ ආයතනයකට වගකීම පවරා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

2004/2026

ගරු රවී කරුණානායක මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහවැලි යෝජනා ක්‍රමය යටතේ ස්ථාපිත මුළු ජල විදුලි ධාරිතාව සහ 2020 වර්ෂයේ සිට මේ දක්වා වාර්ෂික විදුලි ජනනය කොපමණද;

(ii) එම ජල විදුලි පහසුකම් ඉදිකර, සේවාව ආරම්භ කරන ලද දිනය සහ එම ඉදිකිරීම් අනුමත කළ ජනාධිපතිවරයා කවුරුන්ද;

(iii) වික්ටෝරියා, රන්දෙණිගල සහ කොත්මලේ ඇතුළු ප්‍රධාන ජලාශවල වත්මන් අවසාදිත මට්ටම් සහ එමගින් ජලාශවල රඳවා ගැනීමේ ධාරිතාවට ඇති බලපෑම කවරේද;

(iv) පසුගිය වසර 05 තුළ ජලාශ වේලිවල ආරක්ෂාව සහ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වෙන් කරන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(v) වෙනස්වන වර්ෂාපතන රටාවන් හමුවේ කෘෂිකාර්මික වාරිමාර්ග, පානීය ජල සැපයුම සහ විදුලි ජනනය අතර සමතුලිතතාවය පවත්වා ගැනීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වාරිමාර්ග පද්ධතිය මත තැබිය හැකි විශ්වාසය සහ ගංවතුර කළමනාකරණ හැකියාව පිළිබඳව දේශගුණික විපර්යාසවලට ඔරොත්තු දීමේ හැකියාව තක්සේරු කිරීමක් සිදු කර තිබේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?